᛫

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1780/8 – 2012 ඔක්තෝබර් 16 වැනි අඟහරුවාදා – 2012.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: නව/ඉ/1/1/11/එල්ඒ4603.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 03ජේ/83/අයිආර්/28.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිමැටියාවපත්තුව සුළු කොට්ඨාසයේ අංක 645 කෝන්කඩවල ග්‍රාම නිලධාරි වසමේ කෝන්කඩවල ගමේ පිහිටි අ.ග.පි. 3218හි අතිරේක අංක 10හි කැබලි අංක 408 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.0971ක් පමණ වන පහත සඳහන් විස්තර කර ඇති ඉඩම.

01. කැබලි අංක 408
ඉඩමේ නම: දංගහවත්ත; විස්තරය: හේන; හිමිකම් කියන අය: ආර්. එච්. එම්. පුංචිබණ්ඩා, ආර්. එච්. එම්. ඩිංගිරි අම්මා සහ ආර්. එච්. එම්. පී. ඩිංගිරිබණ්ඩා; ප්‍රමාණය: හෙක්. 2.0971ක් පමණ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2012 දෙසැම්බර් මස 19 වැනි දින, පෙ.ව. 10.00 ට නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2012 දෙසැම්බර් මස 05 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආර්. පී. ජී. පොඩිනේරිස්,
ප්‍රාදේශීය ලේකම්,
නවගත්තේගම.

2012 ඔක්තෝබර් මස 15 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 – 58

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.